# ප්‍රවෘත්ති නිවේදනය

<u>එල් ඕ එල් සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් රක්ෂණ සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම</u>

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ වගන්ති ප්‍රකාරව හා එම පනතින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත පවරා ඇති බලතල වලට අනුකූලව, නව රක්ෂණ සමාගමක් ලෙස එල් ඕ එල් සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් ලියාපදිංචි කර ඇත. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 14 වන වගන්තියට අනුකූලව ඉදිරිපත් කරන ලද අයැදුම් පත්‍රය සලකා බැලීමෙන් පසු හා සියළුම නීතිමය අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බැවින් වර්ෂ 2010 අප්‍රේල් මස 30 වනදා සිට දීර්ඝ කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යැම සඳහා එල් ඕ එල් සී ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් වෙත ලියාපදිංචිය ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයට අළුතෙන් එක්වූ මෙම රක්ෂණ සමාගම සමග දැනට සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ කටයුතු සමාගම් 12ක් විසින් කර ගෙන යන අතර දීර්ඝ කාලීන රක්ෂණය පමණක් කරගෙන යනු ලබන සමාගම් ගණන 02කි. සාමාන්‍ය රක්ෂණය පමණක් සමාගම් 05ක් විසින් කරගෙන යන අතර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ දැනට ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් ගණන 19ක් වේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

2010.05.03